055292
ML/PR
2017/09/0

# පහතරට ශාන්තිකර්මවල බෞද්ධාගමික මුහුණුවර හා රෝග නිවාරණය

ඩී.පී. රෝහණ පීරිස්

DD/MA/DA08/049

2014 මැයි

පශ්චාද් උපාධි නිබන්ධනයයි...

055292

නර්තන හා නාට්‍ය කලා පීඨය,

# හැඳින්වීම

පහතරට ශාන්තිකර්ම වූ කලි මෙරට ජනතාව තුළ කාලාන්තරයක් තිස්සේ පැවති ඇදහිලි - විශ්වාස වෙනත් සංස්කෘතීන්ගෙන් පෝෂණය ලබා ගොඩනැගුණකි. අදෘශ්‍යමාන බලවේග පූජ්‍යත්වයට පත් කොට පුද - පූජා පැවැත්වීමෙන් ලෞකික දිවිය සාර්ථක කරගැනීමටත් සශ්‍රීකත්වය උදාකර ගැනීමත් මෙකී ශාන්තිකර්ම පැවැත්වීමේ මූලික අභිප්‍රාය වෙයි. ඒ අතර රෝග නිවාරණ උපක්‍රමයක් ලෙස ද මේ කෙරෙහි නැඹුරු වීමක් දක්නට ඇත.

බුදු දහමෙහි මූලික අරමුණ වන්නේ සංසාර දුකින් මිදී නිවන පසක් කර ගැනීම වුවත්, අනුගාමිකයන්ගේ ලෞකික ජීවිතයේ බලාපොරොත්තු ඉටු කිරීම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා නැති බව මුල් බුදු සමයෙන් දැක ගත හැකිය.

ආගමක් අභිනවයෙන් සමාජයක් වෙත හඳුන්වාදීමේ දී නව සමාජයේ එතෙක් පවත්නා ඇදහිලි - විශ්වාස, සිරිත් - විරිත් සහමුලින් ඉවත දැමිය නො හැකිය.

බුදු දහ ම ද මෙරට තුළ ව්‍යාප්ත වීමේ දී එතෙක් පැවති ඇදිහිලි - විශ්වාස කෙරෙහි යම් බඳු සහනශීලී පිළිවෙතක් අනුගමනය වී ඇති බව පැහැදිලිය. ඒ අතර මහායාන බලපෑමෙන් ව්‍යාප්ත වූ පුද - පූජා මෙහිලා විශේෂ වෙති. එකී පුද - පූජා මගින් සිංහල බෞද්ධයාට තම ලෞකික ජීවිතයේ බලපාන ලෙඩ - රෝග, අතුරු - ආන්තරා වලින් මිදීමට සහනදායී ක්‍රමයක් විය. ඒ වූ පුද - පූජා ශාන්තිකර්මයන් හි බෞද්ධාගමික ලක්ෂණ ගොඩ නැගීමට මූලික වූ බව දැකිය හැකිය. පසුකාලීන ලාංකේය ඇදහිලි - විශ්වාස මත භාරතීය දේව විශ්වාසයන්ගේ බලපෑම හේතුවෙන් විධිමත් ශාන්තිකර්ම පද්ධතියක් සකස් වී ඇත. එක් එක් කාලයන් හී පැවති ආගමික හා දේශපාලනික මතවාද මෙකී ශාන්තිකර්ම කෙරෙහි බෞද්ධාගමික මුහුණුවරක් ආරෝපණය වීමට බලපා ඇති බව පෙනී යයි. ඒ වූ බෞද්ධාගමික ලක්ෂණ පහතරට ශාන්තිකර්ම හා රෝග නිවාරණය පිළිබඳ විමර්ශනයකට ලක් කිරීම මෙම නිබන්ධනයෙහි ලා උත්සුක වීමු.